මහින්ද දිසානායක දිවුල්ගනේ

# "මගේ සඳ ඔබ" ප්‍රණාම මධුර ගීතාවලිය
# "නන්දා මාලිනිය හා ටී එම් එක්ව ගයයි"

සුමට සුලලිත වූ හරවත් දේශජ සංගීත නිර්මාණ බිහිකර සිය මව්බිමේ හුදී ජන පහන් සංවේගය සඳහා නන්දා මාලිනිය කර ඇත්තේ උදාරතම වූ සේවයකි. ඇය, නිර්මාණශීලි කාල පරාසය තුල කුශලතාවයෙන් කීර්ති රාවයෙන් ජනහදවත් ආ......ලනය කරන්නට සමත් විය. එසේම ඒ ඔස්සේ මෙරට සංගීත විජිතය විජයග්‍රහනය කරමින් නන්දා මාලිනිය දශක 5ක් එනම් පනස් වසරක් සංගීත දිවිය සමරනු ලබයි.

අරුත්සුන් අනුකාරක සංගීතයෙන් රසකි පරපුරක් අන්දමන්දව සිටි යුගයක ඇය සංගීත ක්ෂේත්‍රයට පිවිස සැබෑ සංගීත නිර්මාණ රස පිණිස පිළිබඳ රසික නැණ පහන් දල්වමින් ස්කන්ද නිර්මාණකාමී යෞවනැත්තියක සේ, වසරින් වසර සිය සංගීතඥාණය පුළුල් කරගනිමින් හරවත් කරගනිමින් නිර්මාණ පන්නරය දියුණු තියුණු කරගනිමින් සංගීත සාගරයෙන් උකහා ජන සවනට නැණසට දුන් සත්සර මිහිර කොතෙක්දැයි මෙරට බුද්ධිමත් සංගීත විචාරකයන් ශ්‍රාවකයන් දන්නා කරුණකි. නන්දා මාලිනිය නම් ඇය ගුණ මාලියන්ගේ මේ ගාන්ධර්වවරියගේ සත්සර නිර්මාණ ශ්‍රවණයෙන් ලද වින්දනීය අතීතයද, වර්තමානය ද නිරන්තර නැගෙන ලෙලන විල්දිය තරංගයක් සේ සිත්හි වඩනා ආනන්දය හා ආශ්වාදයෙන් යුතුවය.

නන්දා මාලිනිය නම් ව අද්විතීය කුසලතා පූර්ණගාන්ධර්ව වරිය දශක 5ක් පුරා එනම් 50 වසරක් පුරා කළ සංගීත නිර්මාණ පිළිබඳ විමස බලන විටදී ඇය සිංහල සංගීත ගායනා කරලියේ විශාරද නන්දා මාලිනිය භූමිකාව වනාහි බෙහෙවින් ආකර්ශනීය වූ රමණීය වූද ප්‍රබල වූද එකකි. සත්‍යයේ ගීතය, සවන, නැනි ප්‍රසංග තුලින් ප්‍රේක්ෂක ජනතාව ගීතයෙන් අවධි කරන්නට, ගීතයෙහි සංගීතයෙහි රස මේ යැයි පසක් කරන්නට හැකිවිය.

"තුන් හෙලේ කැලෑ තුල සිංහ පැටව්" වැනි දේශානුරාගී ගීත, නිදා වැටී සිටි හෙලයින් අවධිකරන්නට තරම් මේ ගීත ප්‍රබල විය. වරෙක බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩීගිය සිත් ඇත්තී, බුදු සාදු මම, බදු කරුණාදාස තෙමී ආදී ගීත ගායනා කළාය. ප්‍රේමයේ ඇති උත්තරීතර බවත් විරහ වේදනාවේ ඇති කටුක වින්දනීය බවත් පසක් කරන්නට සාහිත්‍ය රස පිරි භාෂා ගුණාත්මකබවින් පරිපූර්ණ ගීත ගායනා කළාය. "ඔබයි රම්‍ය සඳකිරණ" "ප්‍රේමය නම් රාගයෙන් තොර" ගීත මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය. මව් ගුණය ගැන කතා කරන ගීත බොහොමයක් වැතත් 'මිහි මඬලේ අඳුරු කුසේ ' ගීතය අති විශිෂ්ඨ නිර්මාණයක් ලෙස හැඳින්විය හැකිය. ඇය ගායනා කර ඇති ගීත මෙපමණයයි කිව නොහැකි සිය ගණනකි. ඒ සෑම ගීතයක්ම අර්තවත්ය. රසික ජනතාව ආනන්දයේ සිට ප්‍රඥාව කරා මෙහෙයවන ගීතම වේ.




සංගීත දිවිය පුරා වසර 40ක් පමණ සපුරමින් ශ්‍රාවක හදවත් අදද ආනන්දයට පත් කරමින් තම ගායනා සංගීත දිවිය ඔපවත් කරමින් සපැමිණි මේ කලාකරුවා නම් සංගීතනාචාර්ය විශාරද ටී. එම්. ජයරත්නයන්ය. හැත්තෑව දශකයේ තම ලායවින්ත වූ හඬ අවධිකරමින් ගැයූ "ගාන තෙල් සඳුන් වරලස" ගීතය ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූදා සිට ජනගීත පරියේෂනාත්මක කටයුතු ගුණතිලක මහාත සමඟ තවදුරටත් ඉදිරියට පවත්වාගෙන ගිය අතර ටෙලිනාට්‍ය හා චිත්‍රපට පසුබිම් ගායකයෙකු ලෙස  චිත්‍රපට, ටෙලිනාට්‍ය රාශියකට පසුබිම් ගීත ගායනා කලේය. ප්‍රේමසිරි කේමදාසයන් සංගීතවත් කළ "ලා හිරු දහසක්" හදීන් ධර්මසිරි බණ්ඩාරනායකලේ හංසවිලක් චිත්‍රපටය සඳහා "හෙමින් සැරේ පියා විදා" සුනිලා අබේසේකර සමග භාවිතා කරන්නට යෙදුනි.

සමහර ගීත සඳහා ඔහු සංගීතය මුසු කළ ටී.එම්. පසුව ගීත ගායනයට යෙදුනි. විශාරද නීලා වික්‍රමසිංහ සමඟ ගායනා කළ සුමියුරු ගීත රසික පිරිස ආදරයෙන් වැළඳගත් හා "මේ අයුරින් අපි" "සිතින් මා නොසැලී සිටින්නම්", "හඳුනා ගත්තොත් ඔබ මා" වැනි ගීත ආදරේ සුන්දර බව හා විරහ වේදනාවේ කටුක පව පසක් කරන්නට හැකි විය.

තේන්නකෝන් මුදියන්සේලාගේ ජයරත්න නොහොත් ටී. එම්. ජයරත්න නම් විය. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ දොඩංගොඩ ග්‍රාමයේ උපත ලැබූ එතුමා පාඩුව සංගීත ගුරුවරයෙකු විය. වයලීන් වාදනයට දක්ෂයෙක් වුවද වාදනව අතහැර ගායනව මුල් තැන් දුන් එතුමාගේ අනන්‍යවූ ලගන්නා වූ මධුර ගී හඬ ශ්‍රී ලාංකීය රසික පිරිස ආදරයෙන් වැලඳ ගත්හ. මුලින් ජන ගී ගායනයෙන් තම සංගීත දිවිය ආරම්භ වුවද පසු කාලයේදී ටෙලිනාට්‍ය හා චිත්‍රපටි ගීත සිය ගානක් ගායනය කරන්නට යෙදුනි. අඳුරු කුටිය තුළ" වැනි ගීත රසික හදවත් තදින් ස්පර්ෂ කරන්නට සමත් විය. "අම්මා සඳකි" "දුකේදී හැඬුමට" රත්තරන් නෙත් දෙකින්" "එක සිත දෙතැනක" "ඔබ හා මෙමා" "පවනට සැලෙනා" මේ සෑම ගීතයක්ම හැත්තෑව, අසූව, අනූව දශකවල රසික හදවත තදින් ඇද බැඳ ගන්නට සමත් වූවා පමණක් නොව අදත් හෙටත් ශ්‍රාවක හදවත් වල සාදා ලැගුම් ගන්නට සමත් වූ සාහිත්‍ය රස පිරි ගීත වේ.

වැඩි වාර ගනනක් ජනාධිපති සම්මානයෙන්ද සරසවි සම්මාන හා රයිගම් ලැබීමට වරම් ලැබීය. අනුකරණවාදී සංගීත කලාවකින් වල්මත්ව හෙම්බත් වී සිටි බහුතර සංගීතකාමී රසික පරපුරක් යහපත් ව සංගීතයක පහස ලබා දෙන්නට අභියෝගකාරී ව්‍යායාමයක නිරත වූ මෙතුමා ස්වභාවික ගීතයේ මහා ස්පර්ශය, ආග්‍රහනය විදිමින් තම ගීතය රසික පිරිස ශ්‍රාවක පිරිස වෙත තිළිණ කළේය.